# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2696211-13 / Telephone (94) 011- 2166000
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2695279 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: information@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site


---

මගේ අංකය / எனது இல / My No: PS/GT/2020 (IIIවෙළුම)
ඔබගේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.01.03

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු

ප්‍රධාන ලේකම්වරු/ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු

කොමිෂන් සභා ලේකම්වරු

දිස්ත්‍රික් ලේකම්වරු

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රැකියා විරහිත උපාධිධාරින් / ඩිප්ලෝමාධාරින් රැකියාගත කිරිමේ වැඩසටහන 2020 යටතේ බඳවාගත් පුහුණු අභ්‍යාසලාභින් රාජ්‍ය සේවයේ තනතුරුවලට ස්ථිර පදනමින් පත්කිරිම</u>**

නිදහස් අධ්‍යාපනය මුලික කරගෙන පිහිටුවා ඇති උපාධි/ ඩිප්ලෝමා පිරිනමනු ලබන ආයතන වලින් පිටවන තරුණ ජවය ඵලදායි ලෙස රටේ සංවර්ධන කටයුතුවලට යෙදවීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමා විසින් 2020 වසරේ යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකට අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබු තීරණ අනුව රැකියා විරහිත උපාධිධාරින්/ ඩිප්ලෝමාධාරින් රැකියාගත කිරීමේ වැඩසටහන යටතේ බඳවාගත් උපාධිධාරින් 51682 ක් පමණ මේ වන විට විවිධ රාජ්‍ය ආයතනවල පුහුණුව ලබමින් සිටිති. එම අභ්‍යාසලාභින් අතරින් වසරක පුහුණුව සම්පුර්ණ කළ උපාධිධාරි අභ්‍යාසලාභින් 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරින් ලෙස ඒකාබද්ධ සේවයට හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයට පත් කිරිමට සහ වසරක පුහුණුව සපුරා නොමැති උපාධිධාරි අභ්‍යාසලාභින් 2022.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි ස්ථිර සේවයට පත් කරන තෙක් 2022.01.03 දින සිට ස්ථිරවම නව පුහුණු ස්ථාන වෙත අනුයුක්ත කිරිමට 2021.09.13 දින රැස්වූ ආමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම මෙම වැඩසටහනට අදාළ කාර්යපටිපාටිය සම්බන්ධ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද මේ වන විට මා වෙත ලැබී ඇත.

02. ඉහත වැඩසටහන යටතේ ඒකාබද්ධ සේවයට අදාළව ලබා දෙන පත්වීම් ලිපි මේ වන විටත් මුද්‍රණය කර ඔවුන් අනුයුක්ත කරනු ලබන ආයතනවලට යොමු කිරිමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.

03. ඊට අමතරව මගේ 2021.12.10 දිනැති ලිපිය මගින් පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි පත්විම් ලබා දිම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව එක් එක් පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර පත්විම් ලබා දිය යුතු නිලධාරින්ගේ නාම ලේඛන අදියර 2 කින් පළාත් සභා වෙත යැවීමට දැනටමත් කටයුතු කර ඇත.

**04.** රාජකාරි භාර ගැනීම

**මෙම ස්ථිර පත්වීම් ලබා දීමේ ක්‍රියාවලියේ රාජකාරි භාරගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකසා ගැනීම කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.**

i. නිලධාරින් අනුයුක්ත කර ඇති සේවා ස්ථාන 2022.01.07 දින සිට මෙම අමාත්‍යාංශයේ MISCO මෘදුකාංගය වෙත ප්‍රවේශවීමෙන් දැන ගැනීමට සියලු නිලධාරින්ට අවස්ථාව ලැබේ. එමෙන්ම අදාළ ආයතන ප්‍රධානීන්ට ද ඉහත මෘදුකාංගය වෙත ප්‍රවේශ වීමෙන් තම ආයතනය වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරින්ගේ තොරතුරු ද ලබා ගත හැකි වේ. ඒ අනුව සුදුසු කාලසටහනකට අනුව නිලධාරින් ගෙන්වා රාජකාරි භාර දීම මැනවි.

**සටහන:-**

**නිලධාරින්ගේ පත්වීම් ලිපියේ මුල් පිටපත් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිටපත් යන 2ම කට්ටලයක් ලෙස සකසා පරික්ෂා ලැයිස්තුවක් ද සමගින් ඔබ වෙත යොමු කරනු ලැබේ.**

ii. උක්ත වැඩසහන යටතේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්වීම් ලිපි නිකුත් කරන සියලුම නිලධාරින් අනුයුක්ත කරනු ලැබ ඇත්තේ පදිංචි දිස්ත්‍රික්කය/ පළාත තුළම අනුයුක්ත වීමට හැකි වන පරිදි උපාධිධාරි කාර්ය මණ්ඩල අවශ්‍යතාව සලකා වේ. උපාධිධාරි සේවක සංඛ්‍යා අවශ්‍යතාව දැඩි ලෙස සීමිත වූ දිස්ත්‍රික්ක සුළු ප්‍රමාණයක් හැර ඉහත වැඩසටහන යටතේ පත්වීම් ලබන නිලධාරින්/ අභ්‍යාසලාභින් අති බහුතරයකට සිය පදිංචි ප්‍රදේශයට ආසන්න කාර්යාලයක රැඳී සිටිමින් රජය විසින් දියත් කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා දායක විමට අවස්ථාව සැලසී ඇත.

iii. මෙම වැඩසටහන යටතේ පුහුණුව ලැබූ අධික නිලධාරින් ප්‍රමාණයක් ප්‍රශස්ත අයුරින් පළාත් සභා සහ රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කිරිම ඉතා අපහසු කටයුත්තක් වූ අතර හැකිතාක් දුරට සියලු දෙනාට සාධාරණයක් සැලසෙන පරිදි සිදු කර ඇති බැවින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් තමා වෙත පත්වීම් ලබා පැමිණෙන සංවර්ධන නිලධාරීන් කාරුණිකව පිළිගෙන කාර්ය මණ්ඩල අවශ්‍යතාව පවතින උප කාර්යාල වෙත කඩිනමින් අනුයුක්ත කරනු ලබනු ඇතැයි අපෙක්ෂා කෙරේ.

iv. එහෙත් COVID 19 තත්ත්වය හේතුවෙන් විශාල නිලධාරින් ප්‍රමාණයක් එක් ආයතනයකට එක්වර රාජකාරි භාර ගැනිමට පැමිණිම ගැටලුවක් විය හැකි බැවින් එම නිලධාරින් රාජකාරි භාර ගැනීම සඳහා කැඳවිමට ප්‍රමාණවත් කාලසීමාවක් ලබා දෙනු ලැබේ. එවිට ආයතන ප්‍රධානින්ට ද නිශ්චිත කාල සටහනකට අනුව නිලධාරින් ගෙන්වා රාජකාරි භාර දිමට අවස්ථාව ලැබේ. 2022.01.10 දින සිට සතියක කාල සිමාවක් ඇතුළත නිලධාරින් කැඳවා රාජකාරි භාර දීමට හැකියාවක් ලැබේ නම් එම නිලධාරින්ට ජනවාරි මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ගැනීමට ද හැකියාව ලැබෙන බව ද සැලකුව මැනවි.

**සටහන:-**

**ඔබ විසින් කැඳවන දිනට සේවයට වාර්තා නොකර නවක නිලධාරින් පෞද්ගලික හේතු මත ප්‍රමාද වී රාජකාරි භාරගැනීම සම්බන්ධව පත්වීම් ලිපියේ 2 ඡේදයේ විධිවිධාන පනවා ඇත.**

**v. සියලුම නිලධාරින්/ අභ්‍යාසලාභින් අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයේම රාජකාරි භාරගත යුතු වේ.**

**සැලකිය යුතුයි:-**

**රාජකාරි භාර දිමේ කටයුතු MISCO පද්ධතිය හරහා සිදු කරන ආකෘතිය පිළිබඳ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දෙනු ඇත. ඒ අනුව ඔබ වෙත රාජකාරි භාර ගැනීමට පැමිණෙන නිලධාරින් වෙත පත්වීම් ලිපිය නිකුත් කළ යුත්තේ ඔවුන් රාජකාරි භාරගත් බවට MISCO පද්ධතියේ යාවත්කාලීන කිරිම සිදු කිරිමෙන් අනතුරුවය. එසේම රාජකාරි භාර ගැනීමකින් තොරව එම නිලධාරියා වෙත පත්වීම් ලිපි නිකුත් නොකිරිමට වගබලා ගත යුතුය.**

v. ස්ථිර පත්වීම් ලබන නිලධාරින් මෙන්ම පුහුණු පදනමින් ස්ථිරව සේවා ස්ථාන වලට අනුයුක්ත කරන නිලධාරින් සියලු දෙනා ආයතනවලට අනුයුක්ත කර ඇත්තේ ඔබ විසින් මා වෙත සිදු කරන ලද උපාධිධාරි කාර්ය මණ්ඩල අවශ්‍යතා ඉල්ලීම් පදනම් කරගෙන ය. ඔබ යටතේ පුහුණුව ලැබූ නිලධාරින් ඔබ වෙතම අනුයුක්ත කරන ලෙස නාම ලේඛන ද සමඟ ඇතැම් ඉල්ලීම් ලැබී තිබුන අතර එම ඉල්ලීම් හැකිතාක් දුරට ඉටු කිරිමට උත්සහ කරන ලදී. කෙසේ වෙතත් පළාත් සභාවලට සැලකිය යුතු කාර්ය මණ්ඩලයක් ලබා දීමට සිදුව තිබිම, දැනට සිටින සේවා ස්ථානය පිළිබඳ යාවත්කාලීන කිරීමේ දී නිසි පරිදි යාවත්කාලීන වී නොතිබිම සහ ඇතැම් ඉල්ලීම් ලැබෙන විට පත්වීම් ක්‍රියාවලිය අවසන් වි තිබීම යන කරුණු මත දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සියලු ඉල්ලීම් ඉටු වී නොතිබීමට ද ඉඩ ප්‍රස්ථා පවතී.

vii. පළාත් රාජ්‍ය සේවයට පත්කෙරෙන නිලධාරින් සඳහා රාජකාරි භාර ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල අදාළ පළාත් සභා විසින් සලසනු ඇත.

**සටහන:-**

**අර්ධ රාජ්‍ය ආයතන සහ ව්‍යාපෘතිවල ඉල්ලීම් සැලකිල්ලට ගෙන එම නිලධාරින් ද එම අර්ධ රාජ්‍ය ආයතන/ව්‍යාපෘති අයත් අමාත්‍යාංශ ලේකම්වරු වෙත අනුයුක්ත කර ඇත. එබැවින් එම ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය නිලධාරින් එම ආයතනවලට යොමු කිරිමට කටයුතු සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. එසේ සොයා බැලීමකින් තොරව අවිධිමත් ආකාරයෙන් මෙම අමාත්‍යාංශය වෙත හරවා එවීම තුළ ආයතනවලට අත්‍යාවශ්‍ය කාර්යමණ්ඩලය නොලැබී යාමට ඉඩ ඇති අතර පත්වීම් ලැබූ නිලධාරින් ද අපහසුතාවයට පත්වේ.**

**05. වැටුප් සහ අභ්‍යාසලාභී දීමනා ගෙවීම**

i. ඉහත සඳහන් කළ පරිදි 2022.01.03 දින සිට සංවර්ධන නිලධාරීන් ලෙස පත්කරනු ලබන නිලධරයන්ට ද තවදුරටත් අභ්‍යාසලාභීන් ලෙස අනුයුක්ත කරනු ලබන අභ්‍යාසලාභීන්ට ද වැටුප් සහ අභ්‍යාසලාභී දීමනාව 2022 ජනවාරි මස 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට ප්‍රතිපාදන 2022 වර්ෂය සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට වෙන් කර ඇත. ඔබ වෙත අනුයුක්ත කරන ලද නිලධාරින් සංඛ්‍යාව අනුව ජනවාරි මාසයේදී වැටුප්/ දීමනා ගෙවීමේ ප්‍රතිපාදන මවිසින් ඔබ වෙත වෙන් කරන අතර පෙබරවාරි මස සිට අවශ්‍ය ප්‍රතිපාදන ඔබ වෙත රාජකාරි භාරගත් නිලධාරි සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි විමසා වෙන් කර ගත හැකිය.

ii. පළාත් සභා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම අමාත්‍යාංශය මගින් එක් එක් පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු වෙත වෙන් කරනු ලැබේ.

iii. කෙසේ වුවද 2021 දෙසැම්බර් මස සඳහා වන අභ්‍යාසලාභී දීමනාව දැනටමත් ගෙවනු ලබන ආකාරයටම අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින්ම ගෙවීමට දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළ යුතු වේ.

iv. සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අනුයුක්ත කිරීම සඳහා අමාත්‍යාංශ වෙත පත්කළ සංවර්ධන නිලධාරීන්ට ද වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශය මගින් අදාළ රේඛීය අමාත්‍යාංශ වෙත ලබා දෙනු ඇත.

v. එසේ වැටුප් ගෙවීමේ දී රාජකාරි භාර ගන්නා දිනයට පෙර දින දක්වා එම නිලධාරියා පූර්ව පුහුණු සේවා ස්ථානයේ අඛණ්ඩව පුහුණුව සඳහා වාර්තා කළ බව සනාථ කර ගැනීම මැනවි.

vi. 2023 වසරේ සිට වැටුප් ගෙවීම සඳහා පළාත් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් සලසනු ඇත.

**06. කාර්ය මණ්ඩල අනුමැතිය**

i. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිලධාරීන් අනුයුක්ත කරනු ලැබ ඇත්තේ ඔබ විසින් සිදු කරන ලද කාර්යමණ්ඩල අවශ්‍යතා ඉල්ලීම පිළිබඳව මෙම වැඩසටහනට මඟ පෙන්වීම සඳහා පත්කළ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ දී සාකච්ඡා කිරීමෙන් අනතුරුවය.

ii. තව ද ජාතික පාසල්, පළාත් සභා පාසල් සහ අධ්‍යාපන කාර්යාලවලට අනුයුක්තව සිටින පුහුණු අභ්‍යාසලාභීන් මේ අවස්ථාවේදී පාසල් තුළම තාවකාලිකව රැඳවීමට ගනු ලැබූ තීරණය අනුව එම අභ්‍යාසලාභීන් ඒකාබද්ධ සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන් ලෙස පත්කරනු ලැබ ඇත.

iii. කෙසේ වුව ද මෙම වැඩසටහනට සමගාමීව සිදු කරනු ලබන ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම් වැඩසටහනට අදාළ සේවක සංඛ්‍යා සමාලෝචනය මගින් හෝ අන්‍යාකාරයකින් පාසල් තුළ පුරප්පාඩු වන සංවර්ධන නිලධාරි තනතුරු යටපත් කිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අදාළ පළාත් ප්‍රධාන ලේකම්වරුන් ද සම්බන්ධීකරණය කරමින් වසරේ එක් එක් කාර්තුව අවසන සිදු කළ යුතුය .

iv. මෙම උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහනට අදාළව පත්කරන ලද නිලධාරි කමිටුවේ සාමාජිකයෙකු ලෙස කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් ද කටයුතු කළ අතර මෙම වැඩසටහන යටතේ කාර්යමණ්ඩලය අනුයුක්ත කිරීම දීර්ඝ ලෙස කමිටු සාකච්ඡාවලදී සාකච්ඡා කර අදාළ එකඟතාවලට එළඹී ඇත. එසේම ඔබ වෙත අනුයුක්ත කරන ලද නිලධාරීන් ප්‍රමාණය පිළිබඳ කලමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමට ද ඉදිරියේ කටයුතු කරන බැවින් කාර්යමණ්ඩල අනුමැතීය ලබා ගැනීමේදී ගැටලුවක් පැන නොනඟිනු ඇත.

v. ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වෙත අනුයුක්ත කර ඇති සියලු නිලධරයන්ට රාජකාරි භාරගැනීමට අවස්ථාව සලසා දීම ද, කිසිදු නිලධාරියෙකු අතිරික්ත නිලධාරීන් ලෙස සලකා කටයුතු නොකිරීම ද මැනවි.

07. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ මෙතෙක් ලබා දුන් සහාය අගය කරන අතර ඉදිරියේ දී ද එම සහය ඒ අයුරින්ම ලබා දෙනු ඇතැයි උදක්ම අපෙක්ෂා කරමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:-

1) ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2) අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය
3) අමාත්‍ය මණ්ඩල ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය
4) ලේකම්, මුදල් අමාත්‍යාංශය
5) ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
6) ලේකම්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය
7) ලේකම්, මුදල් කොමිෂන් සභාව
8) අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව
9) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව